

# පියඹ

නිවා විඩා මා හද සනසන්නී
සිතට සෙමෙර රන් පවන් සලන්නී
සදතනික සෙනෙහස ගෙන එන්නී
මා පෙම්බර දේවී

විසිර දුවන සිත රන්දූ
හසරැලි මල් මුව බන්දූ
සඳ සිසිලස මුදු පහස දෙවන්නී
මා පෙම්බර දේවී

ගිම්හානය නෙත දවනා
සන්තාපය හද පෙලනා
සිඳ අමරස සුව සිසිල සදන්නී
මා පෙම්බර දේවී

*රසික සූරියආරච්චි*

එහෙන් ලොක්කාය වැරදුනොතින් කාය
මෙහෙන් ණය බරය උපයන දේ යාය
අතකින් බිල් ගොඩකි, බදු ඇත බොරු බෑය
මරණ ගොඩක් ඇති මිනිහෙක් පැණි කෑය

ශ්‍රියානි පෙරේරා

**කියවන්න... ලියන්න...**
**තොරතුරු දැන ගන්න..**
**www.ketapathpawra.com**
**වෙබ් අඩවියට ගොඩ වෙන්න..**
**සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත්**
**කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.**

# පහන් වැට

පහන් වැට තුළට චිත්
දල්වන්න පහනක්
සුදිලෙන්න කවියක් ව
නුඹේ සිතුවිලි සයුරෙන්

සංස්කරණය
තුෂාරි ප්‍රියංගිකා

# ප්‍රතිරූප

සබඳ මට සමු දෙන්න
ගිම් හලෙන් නික්මෙන්න
ඉතින් සිත ඉඩ දෙන්න
වරක් නෙත සිප ගන්න

දුරින් සිට නොපෙනෙන්න
ඇතොත් ඔබ දැක ගන්න
ඇහැක් වෙයි සතුටින්න
ජීවිතේ විඳ ගන්න

මල් විසුල මග මෙන්න
මතින් ඔබ ඇවිදින්න
රළු පොලොව ඉවසන්න
මා දෙපා පිළිගන්න

ශ්‍රියා කුමාරසිංහ

# ආදරේ අගේ කරන්න නැත්නම් හිරුත් අහක බලාවි

දවස් දෙක තුනක් වැහැල පෑව්වම
පෑව් දවස හැමෝටම අගෙයි
දවස් දෙක තුනකට පෙර
දිගටම තිබුණෙ ඉර අව්ව කියල
අමතක වෙලා වගේ



බිරිඳගෙ ස්වාමියගෙ
දරුවන්ගෙ අම්මගෙ තාත්තගෙ
නෑ මිතුරන්ගෙ ආදරේද
නැති වෙනකොටයි අගේ වැඩි
එතකොට පරක්කු වැඩියි
ඉතින් අපි ඒ ආදරය
නැති වෙනකම් ඉන්නවද
අගේ කරන්න

ඉර අව්ව වගේ
ඔහේ නිකම් හිටියත් හම්බ වෙනවා
දොර ජනෙල් වහගෙන හිටියත්
ලැබෙනව කියල හිතුවොත්
හිරුටත් එපා වෙන කාලයක් ඒවි

නිහාල් රූපසිංහ



# පුංචිම පුංචි සිතුවිලි

රතු පාට
වුණාත්
කහ පාට
වුණාත්
හැම
අරලියා
මලම
එකම සුවඳයි..



-සිරිමල්-



# ස්ත්‍රී

ඇස් නිලුපුල්
නා දළු තොල්
ළමැද හසුන්
ඉඟ මනරම්......

සිතේ කඳුළු
අතේ නහර
හිසේ අවුල්
පයේ විලංගු....!

*වර්ණ රසිකා ඒකනායක*